**බුද්ධශාසන අරමුදල - 2021**

**-----------------------------------**

බුද්ධශාසන අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දැක්විය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වග බලා ගනු ලැබිය යුතුය.

**1.2 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් ඇතුළත් කරන ලද මුදල් රෙගුලාසි 877 (2) (ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 13 වගන්තිය | විගණකාධිපති විසින් පිළියෙල කරනු ලබන වාර්තාව සහ ප්‍රකාශය පාර්ලිමේන්තුවට යැවීමට කටයුතු කළ යුතු වුවත් 2016, 2017 සහ 2018 වර්ෂවල වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2016 සහ 2017 වර්ෂවලට අදාල වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර, 2018 හා 2019 වර්ෂයේ වර්තා ද හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2) | යම් නිශ්චිත කාර්යයකට ලබා ගත් අතුරු අග්‍රිම අදාල කාර්යය නිමවූ විගස පියවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. අවස්ථා 03 කදී ගෙවා තිබූ එකතුව රු.90,000ක් වූ අත්තිකාරම් මුදල් පියවීමට දින 14 කට අධික කාලයක් ගත කර තිබූ අතර අත්තිකාරම් පියවන තෙක් ඉතිරි මුදල් අත රඳවා ගෙන සිට ඇති බව ද නිරීක්ෂණය විය. | නියමිත කාලසීමාව තුළ අත්තිකාරම් පියවීමටත් අත්තිකාරම් ගෙවන අවස්ථාවේදී අදාල පුද්ගලයාගෙන් අත්සන් ලබාගැනීම ඇතුලු සියලු ක්‍රමවේද අනුගමනය කිරීමටත් ඉදිරියේදී එවැනි දුර්වලතා ඇති නොවීමටත් නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| | (ii) මුදල් රෙගුලාසි 757 | ගිණුම් වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | 2022/12/31 දිනට භාණ්ඩ සමීක්‍ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, එම සමීක්‍ෂණය සිදුකර වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (ඇ) | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 (ආ) 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය | අරමුදලේ අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේදී අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් ලැබී නොමැත. | ජාතික විගණන පනතේ සහ මුදල් රෙගුලාසිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

## 2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 264 අනුව සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත්, (අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ) කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත් නියැදි පරීක්ෂාවේදී රු.4,845,140 කට අදාල ගෙවීම් සම්බන්ධයෙන් ලදුපත් ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, ඇතැම් ගෙවීම් වවුචර් සමඟ වෙනත් ගෙවීම්වලට අදාල රිසිට්පත්/ලදුපත් පරීක්ෂා කිරීමකින් තොරව අමුණා තිබු බව ද නිරීක්ෂණය විය. | රු. 4,845,140ක ගෙවීම් වලට අදාල වවුචර් අතරින්,<br>• නිලධාරීන් විසින් අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ඇත.<br>• අතිකාල හා ගමන් වියදම් ලද බවට තහවුරුවක් ලබා ගෙන ඉදිරිපත් කළ හැක.<br>• වෛද්‍යාධාර ගෙවීම් සම්බන්ධයෙන් බහුතරයක් ලදුපත් එවා ඇති අතර, වෙනම ගොණුවක ගොණු කර ඇත.<br>• සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ මුදල් ගෙවීම් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත සිදුකර ප්‍රගතිය ගෙන්වා ගෙන ඇත. ලදුපත ගෙන්වා ගෙන නොමැති බැවින් ගෙවීම් තහවුරු කර විගණනයට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී.<br>• ඉදිරියේදී කරනු ලබන සියළු ගෙවීම් සඳහා ලදුපත් ලබා ගැනිමට අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබා දී ඇත.<br>• ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමේදී කලින් මස කරනු ලැබූ ගෙවීමට අදාල ලදුපත ලැබූ පසු ඊලඟ මාසයේ ගෙවීම් සිදුකරයි. ඒ අනුව ගෙවීම් තහවුරු කිරීම සඳහා අදාල වවුචරයට ලදුපත ඇමුණා නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත්, කුවිතාන්සියකින් තහවුරු විය යුතු බව |

## 2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලෙන් දීමනා, ආධාර වැනි ගෙවීම් කිරීමේදී බොහෝ අවස්ථාවල අදාල කාලසීමාව | ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමේදී කලින් මස කරනු ලැබූ ගෙවීමට අදාල ලදුපත ලැබූ පසු ඊලඟ මාසයේ | අදාල ආධාර, දීමනා වැනි ගෙවීම් ප්‍රමාදයකින් තොරව |

| | | | |
|---|---|---|---|
| | ඉකුත්වී මාස කිහිපයකට පසු ගෙවීම් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. ඒ අනුව, එකතුව රු.482,500 කට අදාලව මාස 01 සිට මාස 10 දක්වා ප්‍රමාදවීම් නිරීක්ෂණය විය. | ගෙවීම් සිදු කරන බැවින් ලදුපත ලැබීමේ ප්‍රමාදය මත ගෙවීම් කිරීමද ප්‍රමාද වේ. වර්තමානයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී සම්බන්ධ කර ගනිමින් ඉක්මනින් ලදුපත් ගෙන්වා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කර ඇත. | ගෙවිය යුතු බව |
| (ආ) | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 317,400 ක් වටිනා බුද්ධ ජයන්ති කාසි තොගයක් අරමුදල සතුව පැවතියද එම කාසි සම්බන්ධයෙන් සමීක්ෂණයක් මෙම වාර්තාවේ දිනය වන විටත් සිදු කර නොතිබුණි. | 2023 වර්ෂය තුළ නව මණ්ඩලයක් පත්කර සමීක්‍ෂණ කටයුතු සිදුකිරීමට සැලසුම් කර ඇත. | සෑම වර්ෂයකටම වරක් තොග සමීක්ෂණයක් සිදු කළ යුතු බව |
| (ඇ) | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලට අයත් බෞද්ධ ධර්ම ග්‍රන්ථ තොගයේ වටිනාකම රු.6,953,882 ක් වුවද ඊට අදාලව 2016 වර්ෂයෙන් පසු සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2022.12.31 දිනට භාණ්ඩ සමීක්‍ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, එම සමීක්‍ෂණය සිදුකර වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | සෑම වර්ෂයකටම වරක් තොග සමීක්ෂණයක් සිදු කළ යුතු බව |

## 2.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් වියදම් වාර්තා අනුව, සමාලෝචිත වර්ෂයේදී රු.48,446,525 ක් අරමුදලේ ආදායම් ලෙස ලැබී තිබුණ ද එයින් රු.21,766,115 ක් එනම් සියයට 44 ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැයකර තිබුණි. බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය කාර්යයන් සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | බුද්ධශාසන අරමුදල මඟින් ක්‍රියාත්මක කළ හැකි නව ව්‍යාපෘති හඳුනා ගනිමින් ඉදිරි වසර සඳහා පාලක මණ්ඩල අනුමැතිය සහිතව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව දන්වමි. | අරමුදලේ ආදායම් කාර්යක්ෂම ලෙස අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා යෙදවිය යුතු බව |

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති බෞද්ධ පුනරුද අරමුදල අහෝසි කර එකී අරමුදල යටතේ පවතින ගිණුම්වල ශේෂයන් බුද්ධශාසන අරමුදල් ගිණුමට මාරු කිරීමට, එම අරමුදල යටතේ සිදු කර ඇති කාර්යයන් තවදුරටත් බුද්ධශාසන අරමුදල මඟින් පසුවිපරම් කිරීම හා ඉදිරි කටයුතු සිදු කිරීම සහ එම අරමුදල්ද යොදවා තවදුරටත් බුද්ධශාසනයේ උන්නතිය වෙනුවෙන් සිදු කළ යුතු කාර්යයන් වඩාත් ක්‍රමවත්ව ඉටු කිරීම සඳහා 2020 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් 2021 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට හා ඊට අදාල කටයුතු කිරීමට ක්‍රියා කර නොතිබුණි. | බෞද්ධ පුනරුද අරමුදල අවසන් කොට එහි අරමුණු ඉටුවන ආකාරයෙන් 2021 වර්ෂයේ සිට පහත නව ව්‍යාපෘතීන් 02 ආරම්භ කොට පවත්වා ගෙන යනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.<br>• වයස 90 ට වැඩි භික්ෂූන් වහන්සේලාගේ සත්කාර සඳහා මාසික දීමනා මුදලක් ගෙවීම.<br>• සාමණේර ආයතන, පිරිවෙන් හා දහම් පාසල් සඳහා පුස්තකාල පහසුකම් ලබා දීම. | බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් කළ යුතු කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතු බව |

### 3.2 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයට අදාළව අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අදාළව ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොතිබුණු බැවින් අරමුදලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර තිබේද යන්න විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය. | 2021 වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාවක් 85වන පාලක මණ්ඩල වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු බව |